*සියළු ම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

**ගම්පහ අධ්‍යාපන කලාපය**
Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025
Second Term Evaluation - 2025

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 8 | විෂයය Subiect | සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය Time | පැය 02 |

**සැලකිය යුතුයි.**

- **I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **II කොටසේ 01, 02 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

01. විදුහල්පතිතුමා පන්තියට පැමිණ **ආ පයින්ම** ගියේය.
    1. වේගයෙන් 2. පයින්ම
    3. පැමිණි පාදයෙන් ම 4. පැමිණි විගසම

02. කුඩා කල සිටම **පණට පණ මෙන්** සිටි ඔවුහු හදිස්සියේ ම විරසක වූහ.
    1. ඉතා හිතවත්ව 2. නොවෙනස්ව
    3. සජීවී ලෙස 4. ඉතා දැහැමිව

03. දරුවාගේ අසනීපය නිසා ඔහුගේ **මුළු සේසතම** නැති විය.
    1. සියලු වස්තුව 2. හරි හම්බ කළ දේ
    3. සේසත් සියල්ල 4. ඉතිරි කළ දේ

04. අකාරාදී පිළිවෙළට නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
    1. කරුණාසේන, ජයසේන, රාමනායක, ගජනායක
    2. පියසීලි, හේමවතී, ගුණසීලි, යසවතී
    3. දුටුගැමුණු, මහසෙන්, වළගම්බා, සිරිසඟබෝ
    4. කතරගම, කරවනැල්ල, මාවනැල්ල, නාරම්මල

05. ''මිනිසාට විශ්‍රාමය අවශ්‍යයයි'' යන හැඟීම ගැබ්වුණු අවුරුදු චාරිත්‍රය කුමක්ද ?
    1. නව සඳ බැලීම 2. හිසතෙල් ගෑම.
    3. නොනගතය 4. වැඩ ඇල්ලීම.

06. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
    1. මධ්‍යසාරය, ප්‍රසංශාව, පරිනාමය 2. ප්‍රතිඵලය, සම්ප්‍රදය, දෘෂ්ටිය
    3. ප්‍රස්ථාරය, විමර්ශණය, පිලිරුව 4. කාර්යාලය, ශිෂ්ඨාචාරය, පුස්ථකාලය

- **පහත ප්‍රකාශවලට ගැළපෙන ප්‍රස්තාව පිරුළු තෝරන්න.**

07. විනාශයක් කරමින් තම අවශ්‍යතාවය ඉටු කර ගැනීම.

1. අශ්වයාට අං ආවා වගේ. 2. අන්දරේ සීනි කෑවා වගේ.
3. අළු ගොඩට පිම්බා වගේ. 4. අතු කඩා මොර කන්නා සේ.

08. සිදුවන්නට තිබෙන අවනම්බුව ගැන නොසිතා කටයුතු කිරීම,

1. උගුරට හොරා බේත් බොනවා වගේ. 2. උඩ බලාගෙන කෙළ ගහනවා වගේ.
3. උරුලෑවා ගිය පාර වගේ. 4. ඉඹින්න දුන් අත හපා කෑවා වගේ.

- **මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදයක් ඇතුළත් පදය තෝරන්න.**

09. ආධුනික

1. ළාමක 2. විශේෂී 3. ප්‍රවීණ 4. උත්තම

- **මුලින් දී ඇති පදයට අදාළ බහුවර්ථ පදයක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.**

10. ආලෝකය

1. අලු 2. ප්‍රභාතය 3. තිමිර 4. එළිය

11. 'බලයි' යන ක්‍රියා පදයේ උත්තම පුරුෂ, අතීත කාල බහු වචන රූපය වන්නේ,

1. බැලූහ 2. බැලීය 3. බැලූමු 4. බැලූහු

12. ''ශිෂ්‍යයා වේගයෙන් ලියයි'' යන වාක්‍යයේ වේගයෙන් යන්න,

1. විශේෂ්‍යයි. 2. නාම විශේෂණයයි.
3. ක්‍රියා විශේෂණයයි. 4. සංඥා නාමයයි.

- **අංක. 13-15 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අදහසට අනුව යෙදිය හැකි තනි පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

13. රජතුමා ඔහුව **<u>පනපිටින් අල්ලා</u>** ගෙනෙන ලෙස රාජ පුරුෂයන්ට දැන්වීය.

1. ජීවග්‍රහයෙන් 2. අත් දෙකෙන් 3. රණශූරව 4. පන නසා

14. නොබෝදා අවසන් වූ රාජ්‍ය උත්සවයේදී **<u>බොහෝ කාලයක සිට පැවත එන</u>** සිරිත් විරිත්වලට මුල් තැන දී තිබුණි.

1. පුරාතන 2. අතීත 3. චිරාගත 4. පාරම්පරික

15. සති අන්තයේ දී **<u>ජනයා ගෙන් පිරී පවතින</u>** බැවින් අම්මා එම දිනවල දී වෙළඳ පොළට යාමට අකමැති වූවාය.

1. ජනප්‍රිය 2. ජනාකීර්ණ 3. ජරාජීර්ණ 4. ජනශූන්‍ය

- **පහත වාක්‍යවල ඉරි ඇඳි පද අයත් වන්නේ,**

16. නිවසට <u>එනතුරු</u> දෙමවුපියෝ බලා සිටිති.

1. නිපාත 2. උපසර්ග 3. සමාස 4. උපමා

17. ගුරුතුමියගේ හදවත <u>වෙඩරු පිඩක් සේ</u> උණු විය.

1. උපමා 2. නිපාත 3. උපසර්ග 4. සමාස

18. කිරිකොළ යන පදය ශබ්ද කෝෂයට ඇතුළත් කිරීමේදී එය යෙදිය යුතු වන්නේ පහත කවර පදයකට පසුවද ?

1. කිරිතෙල් 2. කිරිකෝඩු 3. කිරිකොස් 4. කිරිගඩු

19. මුලින් දී ඇති නාම වර්ගයට අයත් නොවන නිදසුනක් දී ඇති වරණය තෝරන්න.

1. ජාති නාම - දෙල් / නෙළුම් / ගිරා / සඳුන්
2. ක්‍රියා නාම - දුවන / නැටුම් / පිදු / විමසීම්
3. ද්‍රව්‍ය නාම - පොත් / වාහන / දිය / අත්
4. ගුණ නාම - මහත / කරුණා / මැටි / හපන්

20. මුලින් දී ඇති ව්‍යාකරණ විධියට අයත් නොවන නිදසුනක් දී ඇති වරණය තෝරන්න.

1. තද්ධිත නාම - බුද්ධිමත් / පුතණු / ගැමි / හැකියා
2. සර්ව නාම - මොවුහු / ඕ / මැණි / නුඹලා
3. සමාස නාම - ගස්වැල් / සුදන / මුනිපුද / කිරිබත්
4. කෘදන්ත නාම - වචන්නෝ / දුටුවෝ / බලන්න / හිඟන්නා

## II කොටස

- **01 සහ 02 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**1). ඔබ පන්ති කාමරයේදී සිදු කරන ලද නිවැරදිව කියවමු පාඩම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

(i). ඔබ විසින් හඳුනාගත් කියවීමේ මූලික ප්‍රභේද දෙක කුමක්ද ?

(ii). ශබ්ද නගා කියවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 2 ක් දක්වන්න.

(iii). අසා රස විඳීම අරමුණු කොටගත් පැරණි බණ කතා කියවීමේ ශෛලිය කුමක්ද ?

(iv). නිවැරදිව කියවමු පාඩම සිදු කිරීමේදී ගුරුතුමිය විසින් ලබා දුන් උපදෙස් 2 ක් ලියන්න.

(v). පාඩම අවසානයේ ඔබ විසින් ළඟා කරගත් සුවිශේෂී හැකියාවන් 2 ක් ලියන්න.

(vi). නාට්‍යානුසාරී කියවීම යනු කුමක්ද ?

(vii). සංස්කෘත ශ්ලෝක කියවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙක කුමක්ද ?

**2). පහත සඳහන් මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරා ගෙන රචනාවක් ලියන්න.**

(i). අපේ ජනකතා සාහිත්‍යය

(ii). සොබාදම් දිනිතිය සුරකිමු.

(iii). මා දුටු නුවර දළදා පෙරහැර

(iv). විද්‍යාවේ දියුණුව මිනිසාට හිතකරද ?

(v). රබීන්ද්‍රනාත් තාගෝර් කවියා

3). ඩෙංගු උවදුරෙන් ඔබේ දරුවා බේරා ගැනීම සඳහා ඩෙංගු උවදුර ව්‍යාප්ත වන ක්‍රම, ඩෙංගු රෝගියෙකු සිටී නම් කළ යුතු ක්‍රියාමාර්ග හා රෝගය නිසා සිදුවන උවදුරු පිළිබඳව දැනුවත් කිරීමේ රැස්වීමක් 2025 අගෝස්තු 15 දින පෙ.ව. 9.00 ට මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ ප්‍රමුඛත්වයෙන් පැවැත්වීම සඳහා මහජනතාව දැනුවත් කිරීමට දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

**4). පෙළපොත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

(i). ''මේ හොඳි හට්ටිය වහුන් ඇරලවත් නෑනේ''

1. මේ ප්‍රකාශය සිදු කරන ලද්දේ කවුද ?
2. වහුන් අරිනවා යන්නෙන් කුමක් අදහස් කෙරේද ?

(ii). ''අද නැවාම ආයෙ නාන්න තියෙන්නෙ තව දවස් දෙකකින්''

1. මෙහි සඳහන් වන දිනය හඳුන්වන නම කුමක්ද ?
2. ස්නානය කිරීමට පෙර හිසෙහි ගල්වන නානු සකසා ගන්නේ කෙසේද ?

(iii). ''අපිට වෙලා තියෙන්නෙ හරිම කරදරයක්''

1. ප්‍රකාශය අයත් කතාවේ නම කුමක්ද ?
2. එම කතාවේ රචකයා කවුද ?

(iv). ''කොහොමහරි කියන්න හෙට උදේම එන්නය කියලා''

1. මෙම ප්‍රකශය අසා සිටි පුද්ගලයා කවුද ?
2. ප්‍රකාශය උපුටා ගන්නා ලද කතාවේ නම කුමක්ද ?

(v). ''පුංචි දැරිය, ඔබ අපට ඇය සිටින තැනක් පෙන්වන්න''

1. මෙම ප්‍රකාශය කළේ කවුද ?
2. ඇය යනුවෙන් හඳුන්වන්නේ කාටද ?

**5). පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.**

සුදෝ සුදු වැ වලාකුළෙනි
ඇයි මේ සිල් ගත්තා වැනි
මගුලට කළු නොනිසි බැවිනි
එය හැර අපි යමු මෙවෙසෙනි
　　ඉරු දෙවි බබළවයි පහන
　　වලා ඉහළ කෙරෙයි වියන

දිසාවෙනැයි මේ හිරු එන්නෙ පායා
හැරී සිටී සූරියකත් ගසේ මල්
රැසුයි දිලෙන්නේ ලණු සේ ඇදීලා
මගුල් ගෙයක්දෝ ලොව මේ වෙලාවේ

(i). ඉහත කවි පෙළ රචනා කර ඇත්තේ කවුද ?

(ii). මෙහි සඳහන් උපමාවක් ලියන්න.

(iii). කවියේ සඳහන් වන්නේ දවසේ කුමන වේලාවක් පිළිබඳවද ?

(iv). මෙහි සඳහන් නාම විශේෂණ පද 2 ක් ලියන්න.

(v). විරුද්ධ පද ලියා දක්වන්න.

(අ). සුදු (ආ). මගුල්

**6). පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපනක ක්ෂේත්‍රයේ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් හතරෙන් තුනක් පමණ අධ්‍යාපන ලබන්නේ ස්වකීය මාතෘ භාෂාව වන සිංහල මාධ්‍යයෙනි. එසේ වුවත් ජාතික මට්ටමෙන් කැරෙන්නා වූ ඇගයීම් වලදී පැහැදිලි වී ඇත්තේ මාතෘ භාෂාව හා භාෂාවේ විවිධ අංශ පිළිබඳ සිංහල ශිෂ්‍යයන්ගේ දැනීම ගුණාත්මක මට්ටමක නොපවත්නා බවය. එසේම ශිෂ්‍යයන්ගේ පමණක් නොව ගුරු භවතුන්ගේ ද නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය හා ස්වාධීන චින්තනය ඔස්සේ තමන්ගෙන් තම බසට ඉටුවිය යුතු මෙහෙය ඉටු නොවීම ගැනත් අවශ්‍ය දැනුම් ඌනතා ගැනත් විවිධ විවේචන පැතිර පවත්නා බවය.

අපේ අධ්‍යාපන ඉතිහාසයේ මව්බස ඉගැන්වීමේදී අතීත දුර්වලතා හේතු ප්‍රත්‍ය වශයෙන් පැන නැගී ඇති එවන් නන් වැදෑරුම් අඩු පාඩු සකස් කරනු වස් 1999 වසරේ සිට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට අදාළව පාසල් පාදක ඇගයීම් වැඩ පිළිවෙළ අර්ථවත් ලෙසත් ප්‍රබෝධජනක ලෙසත් සාර්ථක කර ගැනීමෙහිලා අර්ථවත්ව දායක වන ආකාරයෙන් සිංහල භාෂා සාහිත්‍ය තරගාවලිය නිර්මාණය කොට තිබේ.

(i). ලංකාවේ ශිෂ්‍යයින්ගෙන් හතරෙන් තුනක් පමණ අධ්‍යාපනය ලබන භාෂා මාධ්‍ය කුමක්ද?

(ii). ජාතික මට්ටමේ ඇගයීම් වලදී මාතෘ භාෂාව පිළිබඳව හෙළි වී ඇත්තේ කුමක්ද?

(iii). සිංහල භාෂා සාහිත්‍ය තරගාවලිය නිර්මාණය කොට ඇත්තේ ඇයි?

(iv). එය කුමන වර්ෂයක අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට අයත් වේද?

(v). පහත සඳහන් වචන වලට සමානාර්ථ පද ලියන්න.

(අ). මාතෘ භාෂාව (ආ). ඌනතා

**7). පහත සඳහන් වාක්‍යවලට ගැළපෙන ආඛ්‍යාත පද යොදා සම්පූර්ණ කරන්න.**

1. ඔි තොමෝ මිහිරි ගී ගයමින් ……………………… (නැටුවෝය / නැටුවාය)
2. කම්කරුවෝ කඩිනමින් වැඩබිම්වලට පිටත් ……………………… (වෙයි / වූහ)
3. තොපි හෙට උදෑසනම පාසල් ……………………… (යන්නෙහි / යන්නෙහු)
4. සියලු ඥාති මිත්‍රාදීහු මේ නිවේදනය ……………………… (පිළිගනීවා / පිළිගනිත්වා)
5. කුසුම් පිපී දස දෙස සුවඳ ……………………… (විහිදුවේය / විහිදුවාය)
6. ඔබ අසරණයන්ට පිහිට ……………………… (වෙහු / වෙයි)
7. ජනාධිපතිතුමිය තෙමහල් විද්‍යාගාරයට මුල් ගල ……………………..……… (තැබුවාය / තැබුවේය)
8. හේ පුස්තකාලයේ පාඩම් ……………………… (කරයි / කරති)
9. මධ්‍යස්ථ විචාරකයෙක් පහළ ……………………… (වේවා / වෙත්වා)
10. ඔවුහු අනතුරු සිදුවූ ස්ථානයට යුහුසුළුව ……………………………..... (පැමිණියෝය / පැමිණියේය)